# ප්‍රසම්පාදන දැන්වීම

## මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස ඉදි කිරීම් අමාත්‍යාංශය මධ්‍යම පළාත

මධ්‍යම පලාත් සභාවේ මාර්ග සංවර්ධන, ප්‍රවාහන විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදි කිරීම් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් ඉදිකිරීම් හා ද්‍රව්‍ය සැපයීම් සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ **("CIDA")** මාර්ග ගොඩනැගිලි සහ සේවා සඳහා වලංගු රජයේ අනුමත ව්‍යාපාර ලියාපදිංචිය (කර්මාන්තයට අදාලව) ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත උපලේඛනයේ සඳහන් කර්මාන්ත සඳහා ලංසු කැඳවනු ලැබේ. ලංසු මුදල රුපියල් මිලියන 5 හෝ 5 ට වැඩි කර්මාන්ත **සමාගම් මැදුරේ 1987 අංක 03 පොදු කොන්ත්‍රාත් පනත** අනුව ලියාපදංචි විය යුතුය.

ඒ අනුව ඔබ ආයතනය මගින් ලංසු ලබා ගැනිමට තීරණය කරන්නේ නම් අදාල කර්මාන්ත සහ ඔබගේ විද්‍යුත් ලිපිනය නිවරැදිව සඳහන් කරමින් ඉල්ලීමේ ලිපියක් **2026.02.13** දින සිට **2026.03.05** දින ප.ව **1.00** ට පෙර **prdatender2026@gmail.com** යන විද්‍යුත් ලිපිනයට යොමු කිරිමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

ලංසු නිකුත් කිරීමේ අවසන් දිනය **2026.03.05** දින ප.ව **4.00** දක්වා වන අතර අනෙකුත් වැදගත් තොරතුරු පහත පරිදි වේ.

1. ඔබ විසින් ඉල්ලුම් කරන කර්මාන්තයට අදාල ආපසු නොගෙවන ලංසුපත් ගාස්තුව සාමාන්‍යාධිකාරි, මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නමින් මහජන බැංකුවේ **අංක 158100110000022** දරණ ගිණුමේ තැන්පත් කරන්න. **මේ සඳහා එක් කර්මාන්තයකට එකක් බැගින් වු මුදල් තැන්පත් කිරීමේ ලදුපතක් භාවිතා කිරීමටත් එහි පැහැදිලිව සහ නිවරැදිව කර්මාන්තයේ නම සහ කොන්ත්‍රාත් අංක සටහන් කිරිමටත් කටයුතු කරන්න.**

2. ලබාගත් රිසිට්පතේ පැහැදිලි පිටපතක් සමඟ ඉල්ලිමේ ලිපියෙහි අදාල කර්මාන්ත නිවරැදිව හා පැහැදිලිව සඳහන් කර පහත විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය. ඉන්පසු අදාල ලංසුපත ඔබ වෙත විද්‍යුත් තැපැල මඟින් යොමු කරන අතර, එසේ තොරතුරු නිවරැදි නොවන්නේනම් දැනුම්දීමකින් තොරව ඔබගේ ඉල්ලීම් ලිපිය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. විද්‍යුත් තැපැල මගින් ඉල්ලීම් ලිපිය සහ ආපසු නොගෙවන ලංසුපත් ගාස්තු ගෙවූ බවට රිසිට්පත භාරගැනිම **2026.03.05** වන දින ප.ව .1.00 ට අවසන් වන අතර, මෙදිනට පෙර ඉල්ලිම් ලිපිය සමඟ ආපසු නොගෙවන ලංසුපත් ගාස්තු ගෙවූ බවට රිසිට්පත ඉදිරිපත් කර ඇති කොන්ත්‍රාත් ආයතන සඳහා පමණක් **2026.02.13** දින සිට **2026.03.05** වන දින ප.ව .4.00 **දක්වා කාර්යාල වේලාවන් තුල** පමණක් ලංසුපත්, ලංසුකරු විසින් ඉල්ලීම් ලිපියේ සඳහන් කර ඇති විද්‍යුත් ලිපිනයට යොමු කරනු ලැබේ.

4. **2026.02.20** වන දින පෙ.ව **10.30** ට පූර්ව ලංසු රැස්වීම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 09, ඇහැලේපොළ කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර යන ලිපිනයේ දී පැවැත් වේ.

5. අදාල ලංසු පත්‍රිකාවල මෘදු පිටපත් ඔබගේ විද්‍යුත් ලිපිනයට යොමු කිරිමට කටයුතු සිදු කරන අතර ඔබ විසින් ලංසු මුල් පිටපත සහ අනුපිටපත ලෙස දෘඪ පිටපත් 02 ක් ලබා ගැනිමට කටයුතු කළ යුතුයි. **ඔබ වෙත යොමුකර ඇති ලංසු පත්‍රිකාවල මෘදුපිටපතේ ඇතුලත් සියලුම පිටු ඔබ විසින් ඉදිරිපත් කරන ලංසු පත්‍රිකාවල මුල්පිටපතේ සහ අනුපිටපතේ ඇතුලත් විය යුතුය.** ලංසු බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර ඇමුණමේ සඳහන් පරිදි කර්මාන්තයට අදාල අනු අංකය හා කර්මාන්තයේ නම සහ මුල්පිටපත ද අනු පිටපත ද යන්න පැහැදිලිව හා නිවරැදිව සඳහන් කිරිමට කටයුතු කරන්න. නිසි ලෙස සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත සහ අනු පිටපත වෙන්වෙන්ව කවරවල බහා එම කවර දෙකම එක්

කවරයක බහා සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය, මාර්ග සංවර්ධන, ප්‍රවාහන විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, අංක 109, යටිනුවර වීදිය, මහනුවර යන ලිපිනයට **2026.03.06** වන දින **පෙ.ව.10.30** ට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ඒ සඳහා එම කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියේ තැන්පත් කිරීමට කටයුතු කරන්න.

6. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම මාර්ග සංවර්ධන, ප්‍රවාහන විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදි කිරීම් අමාත්‍යාංශය අංක 109, යටිනුවර වීදිය, මහනුවර යන ලිපිනයේ දී සිදු කරනු ලබන අතර ඒ සඳහා ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

7. අවශ්‍ය වෙනත් විස්තර සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 09, ඇහැලේපොළ කුමාරිහාමි මාවත, බෝගම්බර. මහනුවර වෙතින් හො දුරකථන අංක 081-2052279, 081-2204378, ඇමතීමෙන් ලබා ගත හැකිය.

8. මෙම ප්‍රසම්පාදන දැන්වීම සහ ඊට අදාල විස්තරවල සංශෝධන සිදුවේ නම් ඊට අදාල සියලුම විස්තර මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ **www.prda.cp.gov.lk** වෙබ් අඩවියේ ද පළකරන බව කාරුණිකව දන්වා සිටිමි.

මෙම කර්මාන්ත පිරිනැමීමේ දී 2025 වර්ෂයේ කොන්ත්‍රාත් ආයතන මගින් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරන කර්මාන්තවල ප්‍රගතිය කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ දී විශේෂයෙන් සැලකිල්ලට ගනු ලැබේ. එම කර්මාන්තවල දුර්වල ප්‍රගතිය වාර්තා වී ඇත්නම් එම ලංසුකරුට නව කර්මාන්තයක් පිරිනමන්නේද? නැද්ද? යන්න පිළිබඳ අවසන් තීරණය ප්‍රසම්පාදන මණ්ඩලය විසින් ගනු ලැබේ. තවද මේ සඳහා එක් පුද්ගල නාමයක් යටතේ ඇති ආයතනය හෝ ආයතන මගින් 2025 වර්ෂයේ ඉටුකළ කර්මාන්තවල පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සිදු කරන ලද කොන්ත්‍රාත් කාර්ය සාධනය ද අදාල කරගනු ලැබේ. තවද මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා අදාල වන චක්‍රලේඛවලට අදාල විධිවිධාන ප්‍රසම්පාදන කටයුතු සඳහා අදාල කරගනු ලැබේ. එසේම එක් කොන්ත්‍රාත් ආයතනයකට එක් කර්මාන්තයකට වඩා පිරිනමන්නේද යන තීරණය ප්‍රසම්පාදන මණ්ඩලය විසින් ගනු ලැබේ.

ලංසු ලේඛන සමඟ ඔබ විසින් ලබා දෙන ලිපි ලේඛන නිවරැදිව සහ ලංසු පත්‍රිකාවේ දී ඇති උපදෙස්වලට අනුකූලවම ඉදිරිපත් කිරීම ඔබගේ වගකීම වන අතර අදාල තොරතුරු නිවරැදිව ඉදිරිපත් නොකිරීම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. තවද ඕනෑම ලංසුවක් හෝ සියලුම ලංසු ඒ සඳහා හේතු දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීම සහ ප්‍රදානය කිරීම තීරණය කිරීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන අතර, අවම මිල ගණන් සඳහන් ලංසුව භාර ගැනීමට ද බැඳීමක් නොමැත.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව.

මාර්ග සංවර්ධන, ප්‍රවාහන විදුලිබල හා
බලශක්ති සහ නිවාස හා
ඉදි කිරීම් අමාත්‍යාංශය
අංක 109, යටිනුවර වීදිය,
මහනුවර.